# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2090/19 - 2018 සැප්තැම්බර් මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2018.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BD/HD/LND/3/1/NWS&DB/2.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දපල්ල කෝරළයේ වල්හපුතැන්න ග්‍රාම නිලධාරි වසමේ වල්හපුතැන්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අ.ග.පි. 295 හි සංශෝධන අනුරේඛන බී/එච්එල්ඩී/2018/198 අංක දරන 2018/08/10 දිනැති පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2605ක් පමණ වූ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්;

**ඉඩම් අත්පත් කරගන්නා මහජන කාර්යය** :- හල්දුම්මුල්ල බෙරගල ජලසම්පාදන ක්‍රමයේ වල්හපුතැන්න ජල පොම්පාගාරය හා කාර්යාලය ඉදිකිරීමට

01. කැබලි අංක 280 - **ඉඩමේ නම: වල්හපුතැන්නේ වත්ත; හිමිකම් කියන අය: ඩබ්. රසිකා දමයන්ති, දිගරේද්ද කුඹුර, කහගොල්ල, දියතලාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0572;**

උතුරට: කැබලි අංක 38 සහ 281; නැගෙනහිරට: කැබලි අංක 281; දකුණට: කැබලි අංක 38; බටහිරට: කැබලි අංක 38 සහ 42.

02. කැබලි අංක 281 - **ඉඩමේ නම: වල්හපුතැන්න පතන; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2033;**

උතුරට: කැබලි අංක 280, 38, 215, 218, 220, 221, 222 සහ 223; නැගෙනහිරට: කැබලි අංක 281, 220, 221, 222 සහ 223; දකුණට: කැබලි අංක 282, 38 සහ 280; බටහිරට: කැබලි අංක 282, 38, 42 සහ 280.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 ඔක්තෝබර් මස 31 වැනි දින පෙ.ව. 10.00ට හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2018 ඔක්තෝබර් මස 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජේ.එම්.චමිල ඉන්දික ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හල්දුම්මුල්ල.

2018 සැප්තැම්බර් මස 19 වැනි දින,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 321


1A - G28594 - 17 (2018/09)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.